# කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස ආදායම් ණයගැතියන් යටතේ රු.31,657,999 ක් දක්වා තබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය හිඟ මුද්දර ගාස්තු ආදායම රු.11,000,000 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.20,657,999 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,311,269 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,915,625 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,610,717 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). දීර්ග කාලයක සිට පැවත එන ගිණුම් විෂයයන් 7 ක් යටතේ පැවති රු.165,101 හර ශේෂයක්ද, ගිණුම් විෂයයන් 4 ක් යටතේ පවතින රු.859,747 බැර ශේෂයක්ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ආ). පොදු බැංකු ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී ප්‍රධාන මුදල් පොතේ ශේෂය වූ රු.10,255,289 ක වෙනුවට ලෙජර් ගිණුම අනුව වූ රු.10,595,805 ක ශේෂය ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම මෙම ශේෂ දෙකට පරිබාහිර ශේෂයක් වූ රු.10,606,004 ක වටිනාකමක් ශේෂ පත්‍රයේ මුදල් ශේෂය යටතේ දක්වා තිබුණි.

(ඇ). පොදු බැංකු ගිණුමට අදාලව 2011 දෙසැම්බර් බැංකු සැසඳුම අනුව නිකුත් කල නමුත් මාරු නොවූ රු.3,604,456 ක ශේෂය තුල 2009 හා 2010 වර්ෂ වල සිට පැවත එන රු.350,990 ක් වටිනා චෙක්පත් 83 ක් ද පැවතුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ණයගැති ශේෂය තුල 'රාජ්‍යභාග සේවා' යනුවෙන් රු.11,000 ක ශේෂයක් පැවති අතර එය ජල ව්‍යාපෘතියට යොදවාගත් උපදේශකවරයෙකුගෙ දීමනාවෙන් අයකරගත් මුදලක් වන අතර එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | ------------------ | -------------------- | ------- | --------------------- |
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 288 | 291 | 93 |
| (ii). | බදුකුලී | 3,721 | 4,551 | 74 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 732 | 810 | 66 |
| (iv). | වෙනත් ආදායම් | 57,259 | 58,155 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 7,483,641 |
| (ii). | මුද්දර ගාස්තු | 36,379,611 |

2.4 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

සභාවට අයත් රු.1,285,000 ක් වටිනා මාර්ග තලනයක් වර්ෂ 4 ක පමණ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

2.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). කළමනාකරණ සේවයේ අධි පංතියේ තනතුරක් වූ ලේකම් තනතුර 2009 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබූ අතර පළාත් පාලන නිලධාරියකු විසින් වැඩ ආවරණය කර තිබුණි. සභාවට අදාලව අනුමත කාර්මික නිලධාරී තනතුරු සංඛ්‍යාව 4 ක් වුවත් තනතුරු 2 ක් වසරක පමණ කාලයක සිට පුරප්පාඩුව පැවතුනි. එමෙන්ම ආදායම් පරිපාලන නිලධාරී අනුමත තනතුරු සංඛ්‍යාව 4 ක් වුවත් එක් තනතුරක් වසර 3 ක සිට පුරප්පාඩුව පැවතුනි.

(ආ). අනුමත කාර්ය මණ්ඩලය යටතේ කම්කරු, රියදුරු වැනි තනතුරු නාම යටතේ අනුමත සංඛ්‍යාව 53 ක් වූ අතර ඒයටතේ ස්ථිර සේවකයින් 45 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුනද, අනියම්, ආදේශක යටතේ සභාවෙන් වැටුප් ලබන සේවකයන් 6 ක් යොදවා තිබුණි.

(ඇ). සභාවේ අනුමත මාර්ග කම්කරුවන් සංඛ්‍යාව 26 දෙනෙකු වූ අතර සමාලෝචිත වර්ෂය වන විට සේවකයින් 23 දෙනෙකු සේවයේ යොදවා තිබුනත් මෙම කම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් තම නිත්‍ය රාජකාරීවලට පරිබාහිර පුරප්පාඩු නොමැති රියදුරු, කාර්යාල කම්කරු වැනි තනතුරු වලට අනුයුක්ත කර තිබුණි. මාර්ග කම්කරුවන් වෙනත් රාජකාරී වල යොදවා තිබූ බැවින් ඍජු ශ්‍රම පදනම යටතේ ඉදිකරනු ලබන කර්මාන්ත වල ශ්‍රම අවශ්‍යතා ඉටුකර ගැනීමට දින වැටුප් පදනමට තාවකාලික කම්කරුවන් බඳවා ගෙන තිබුණි.

2.6 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ප්‍රාදේශීය සභාව 2010 වර්ෂයේදී ඍජු ශ්‍රම පදනම යටතේ රු.66,964,572 ක කර්මාන්ත 62 ක වැඩ නිමකර තිබූ අතර නියැදි පරීක්ෂාවේදී පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ 2007 ජූනි 01 දිනැති අංක 2007/3/තාක්ෂණ දරන චක්‍රලේඛය අනුව පහත සඳහන් කාර්මික වාර්තා පිළියෙල කර නොතිබුණි.

(i) කර්මාන්ත සඳහා ශබ්‍යතා වාර්තාව, ABC ඇතිරීම ඉංජිනේරු ලෙවලයක් ආධාරයෙන් මට්ටම් උසවල් දැක්වෙන වාර්තාව.

(ii) යන්ත්‍රයක් යොදා ඉටුකරන ලබන කාර්යයන් සඳහා මීටර් පැය ගණන

(iii) ඇස්තමේන්තුවේ හා ප්‍රමාණ පත්‍රයේ මිනුම් සහිතව ඉදිරිපත් කළ යුතු විස්තර

(iv) නිමිවැඩ වාර්තාවට අනුව වියදම් වාර්තාව

(v) ද්‍රව්‍ය හා මිනිස් ශ්‍රම විෂයයන් ඇතුලත් ලාභ/අලාභ වාර්තාව

(vi) ඇස්තමේන්තුගත ගල් වැලි මිලදී ගැනීමට අදාල මිළ කැඳවීම් විස්තර

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). වර්ෂ 10 කට පමණ පෙර වැඩ තහනම් කල නිලධාරියකුගෙන් අයවිය යුතු රු.141,761 ක ණය ශේෂයක් සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර දැනට එම නිලධාරියා අනිවාර්ය නිවාඩු යවා පැවතුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාර්පාලන ) රීති මාලාවේ 228 රීතිය පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ). ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 1,218,448 ක් ව තිබුණි.

(ඈ) ආයතනයට අදාලව සංයුක්ත සැළැස්මක් හා සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාර සැළැස්මක් නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය</u>

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මුල්‍ය පාලනය

(ඇ) ආදායම් පර්පාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පර්පාලනය